# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2023/4 - 2017 ජූනි මස 12 වැනි සඳුදා - 2017.06.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ උකුවෙල වැඩ භාර නිලධාරී කාර්යාලය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 මැයි මස 31 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1277.

**උපලේඛනය**

මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ඊ 355 උකුවෙල ග්‍රාම නිලධාරී වසමේ උකුවෙල ගමේ පිහිටි උකුවෙල වත්ත හා මාරුකොන වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් රූඩ් : 1, පර්චස් 19 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | පුබුදු මාවත ; |
| *නැගෙනහිරට* | : | තිස්ස දවුලගල හිමිකම් කියන ඉඩම සහ අංක : 1657 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක : 2 ; |
| *දකුණට* | : | කලල්පිටිය සිට උකුවෙල දක්වා දිවෙන මාර්ගය ; |
| *බටහිරට* | : | ජිනදාස හිමිකම් කියන ඉඩම සහ ආර්. එම්. සී. රණසිංහ හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ශාන්ති මුණසිංහ මිය,
අංක : 17/14F,
හුලංගමුව පාර,
වලගම්බා පෙදෙස,
මාතලේ.

06 - 923

1A - G 25693 — 40 (2017/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ මාතලේ දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීම සඳහා විකල්ප ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 මැයි මස 18 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැදුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/3/1274.

**උපලේඛනය**

මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, E355 නාගොල්ල ග්‍රාම නිලධාරී වසමේ නාගොල්ලාගම ගමේ පිහිටි ගාඩ්න් ඔෆ් ඊඩ්න් නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් රූඩ් ፡ 1, පර්චස් 15 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ፡

| | | |
|---|---|---|
| *උතුරට* | ፡ | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | ፡ | සැක්ස්ටන් පාර්ක් ; |
| *දකුණට* | ፡ | මායිම් තාප්පය හා බබා අප්පුහාමි හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | ፡ | මහනුවර මාතලේ ප්‍රධාන මාර්ගය (නාගොල්ල පාර). |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* ፡
01. සිරපුඩීන් රෆීනා උම්මා මිය,
02. බදුර්නීසා රෆික් මිය,<br>
අංක 25, නාගොල්ල පාර,<br>
මාතලේ.

06 - 924

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට දිවුලපිටිය ජල සම්පාදන ක්‍රමයේ තුළුමග ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 මැයි මස 31 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැදුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/2/1280.

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක. 54 B කොටදෙනියාව ග්‍රාම නිලධාරි වසමේ කොටදෙනියාව ගමේ පිහිටි තේක්කලන්ද නමැති ඉඩම් කොටස පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. විජිත කේ. පියරත්න මහතා විසින් 2009.10.14 දිනැති ව පිළියෙල කර ඇති අංක 647 දරන සැලැස්මේ කැබලි අක්ෂර A ලෙස දක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 40 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | මහඔය ; |
| *නැගෙනහිරට* | ඃ | සුරංගනී ජයකොඩි හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | ඃ | මෙම ඉඩමේ කැබලි අංක ඃ 31 කොටස ; |
| *බටහිරට* | ඃ | දිවුලපිටිය - ගිරිඋල්ල ප්‍රධාන මාර්ගයේ සිට මහඔය දෙසට වන පාර. (මෙම ඉඩමේ කැබලි අංක ඃ 28 කොටස) |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය ඃ* එච්. ඒ. ප්‍රභාත් චමින්ද හෙට්ටිආරච්චි,
වැලිමංකඩ,
කොටදෙනියාව.

06 - 925

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.